අංකය :

# ගිවිසුම් පත්‍රයයි.

මෙහි පහත සමහර තැනක එකී ණය දීමනාකරු යයි කියනු ලබන සහ එකී පදයේ සම්බන්ධය අනුව අදහස් වන හා පිළිගනු ලබන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභා ලේකම් කාර්යාලයේ සභා ලේකම් ධූරය දරන ........................ ................................................................ යන අය සහ ඒ ඒ අවස්ථාවේදී එකී තනතුරේ අනුප්‍රාප්තිකයන් හා වැඩ බලන පුද්ගලයන්ද පිළිගැනෙන හා අදහස්වන අය එක් පක්ෂයකටද,

මෙහි පහත සමහර තැනක එකී ණය ගැනුම්කරු යයි කියනු ලබන සහ එකී පදයේ සම්බන්ධය අනුව අදහස්වන හා පිළිගනු ලබන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාවේ පළාත් සභා මන්ත්‍රීධූරය දරන ........................................ ........................................................................................................ හි පදිංචි ........................................................................................................ යන අය සහ ඔහුගේ / ඇයගේ උරුමක්කාර, පොල්මඃකාර, අද්මිනිස්ත්‍රාසිකාර, බලකාර, ලැබුම්කාර ආදීන්ද පිළිගැනෙන හා අදහස්වන අය අනෙක් පක්ෂයටද බැඳී එකී දෙපක්ෂය අතර වර්ෂ ......................................ක් වූ ..................................... මස ................ දින කොළඹදී ඇතිකරන ලද ගිවිසුමේ වග මෙසේය.

ඉහත කී ණය ගැනුම්කරු විසින් ඉහත කී ණය ගැනුම්කරුගේ මන්ත්‍රී ධූරයේ රාජකාරි කටයුතු කිරීමේදී, අංක ........................................................................ ලිපිනය ඇති ස්ථානයේ රඳවා තබා ප්‍රයෝජනයට ගැනීම සඳහා පරිගණකයක් මිලදී ගැනීමට ණය මුදලක් නිකුත්කරන ලෙස ඉල්ලා නියමිත ආකෘතියේ වූ අයදුම්පත්‍රයක් සමඟ ඉන්වොයිසියක් ඉදිරිපත්කර ඇති බැවින්ද, ඉහත කී ණය දීමනාකරු විසින් එකී ඉන්වොයිසිය සහ අයදුම්පත පිළිගෙන ඇති බැවින්ද, ඉහත කී ණය දීමනාකරු සහ ණය ගැනුම්කරු අතර පහත සඳහන් කොන්දේසි හා එකඟවීම්වලට අනුව මෙම ගිවිසුමට ඇතුළත්වන බවට මෙයින් සාක්ෂි දරා එකඟවනු ලැබේ.

එකී කොන්දේසි  හා එකඟවීම් කවරේද යත් :-

1. බස්නාහිර පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී ධූරයක් දැරීම, යතුරු ලියන සඳහා ණය මුදලක් ලබාගෙන නොතිබීම සහ කලින් වතාවේදී බස්නාහිර පළාත් සභාවෙන් ලබාදුන් පරිගණක ණය ලබාගෙන වසර පහක් ඉකුත්ව තිබීම මෙම ණය ඉල්ලුම් කිරීමේ මූලික සුදුසුකම් වන බව ණය දීමනාකාර පාර්ශවය කියා සිටින අතර, තමන් එකී සුදුසුකම් සපුරා ඇති බව ණය ගැනුම්කාර පාර්ශවය කියා සිටී.

2. මෙකී ණය මුදල ලබා දෙන්නේ රුපියල් ලක්ෂයක (රු.100,000/-) උපරිමයකට යටත්ව බව ණය දීමනාකරු කියා සිටින අතර, පරිගණකයේ වටිනාකම රුපියල් ලක්ෂයකට වඩා වැඩිනම් ඉතිරි මුදල ණය ගැනුම්කරු විසින් පෞද්ගලිකව දැරිය යුතු බව ණය දීමනාකරු කියා සිටින අතර, ණය ගැනුම්කරු ඊට එකඟ වේ.

3. ණය ගැනුම්කරු විසින් ඉදිරිපත් කළ නියමිත ආකෘතියේ වූ අයදුම්පත්‍රයේ නම් සඳහන්කර ඇති ආයතනය වෙත එකී අයදුම්පත්‍රය සමඟ ඇමිණූ ඉන්වොයිසියේ සඳහන්වන මුදල චෙක්පතක් මගින් අද දින ගෙවන බවට ණය දීමනාකරු කියා සිටී.

   එකී අයදුම්පත සහ ඉන්වොයිසිය මෙම ණය ගිවිසුමේම කොටසක් ලෙස සලකන බවට දෙපාර්ශවයම එකඟ වේ.

4. ණය දීමනාකරු ලබාදෙන ණය මුදලින් පරිගණකය (Computer), මුද්‍රණ යන්ත්‍රය (Printer), විදුලි බල සැපයුම් ඒකකය (U.P.S.) හා ෆැක්ස් හා ඊ මේල් පහසුකම් ලබා ගැනීමට අදාළ මෝඩම් (Modem) අනිවාර්යයෙන්ම මිලදී ගත යුතු බව ණය දීමනාකරු කියා සිටින අතර, ණය ගැනුම්කරු ඊට එකඟ වේ.

5. අද දින සිට දින 14ක් තුළදී ඉහතින් සඳහන් කළ උපාංග සහිතව පරිගණකයක් මිලදී ගෙන පරිගණකයක් මිලට ගත් බවට නියමිත ආකෘතියේ වූ ප්‍රකාශයක්ද සමඟ අදාළ රිසිට් පත ණය දීමනාකරු වෙත ඉදිරිපත් කළ යුතු බව ණය දීමනාකරු කියා සිටින අතර, ණය ගැනුම්කරු ඊට එකඟ වේ.

   අදාළ රිසිට්පත හා ප්‍රකාශය මෙම ගිවිසුමේම කොටසක් ලෙස සලකන බවට දෙපාර්ශවය එකඟ වේ.

6. ඉහතින් සඳහන් කළ ලෙස දින 14ක් ඇතුළත රිසිට් පත ඉදිරිපත් නොකළහොත් ණය දීමනාකරු විසින් ලබාදුන්, මෙම ගිවිසුමේම කොටසක් ලෙස සලකන්නා වූ ඉන්වොයිසියේ සඳහන් මුදල, සියයට පහළොවක (15%) පොළියක් සහිතව, ණය ගැනුම්කරු විසින් බස්නාහිර පළාතේ පළාත් සභා මන්ත්‍රීවරයෙකු ලෙස ලබන්නා වූ මාසික වැටුප් හා දීමනාවලින් අඩුකර ගන්නා බව ණය දීමනාකරු කියා සිටින අතර, ණය ගැනුම්කරු ඊට එකඟ වේ.

7. ණය දීමනාකරු විසින් ණය ගැනුම්කරු සඳහන්කර ඇති ආයතනයට ගෙවන ලද මුළු මුදලින් සියයට පහළොවකට (15%) සමාන මුදලක් ණය ගැනුම්කරු බස්නාහිර පළාතේ පළාත් සභා මන්ත්‍රීවරයෙකු ලෙස ලබන්නා වූ මාසික වැටුප් හා දීමනාවලින් වාරික විස්සකින් අඩුකර ගන්නා බවත් එකී අඩුකිරීම් අද දින සිට වසර දෙකක් තුළදී සිදුකර අවසන් කරන බවත් ණය දීමනාකරු කියා සිටින අතර, ණය ගැනුම්කරු ඊට එකඟ වේ.

8. මිලදී ගන්නා වූ පරිගණකය වෙනුවෙන් ණය දීමනාකරු හට ඉහත අංක 07හි සඳහන් පරිදි තීරණය කළා වූ ණය ගැනුම්කරුගෙන් අයවිය යුතු සම්පූර්ණ මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තුරු මිලදී ගන්නා වූ පරිගණකයේ අයිතිය ණය දීමනාකරු සතුවන බව ණය ගැනුම්කරු පිළිගනී.

9. පරිගණකය මිලදී ගැනීමෙන් පසු සේවා පහසුකම් සැපයීම හා වගකීමේ කාල සීමාව පිළිබඳව ණය දීමනාකරු බැඳීමකට යටත් නොවන බව ණය දීමනාකරු කියා සිටින අතර, එම කටයුතු පිළිබඳ සියලු වගකීම් ණය ගැනුම්කරු දැරිය යුතු බවද ණය දීමනාකරු තවදුරටත් කියා සිටින අතර, ණය ගැනුම්කරු ඊට එකඟ වේ.

10. වාරිකයන් සියල්ලම ගෙවා නිමවීමට පෙර මිලට ගත් පරිගණකය සම්පූර්ණයෙන් විනාශ වීම, සොරා ගැනීම හෝ කිසිඳු ආකාරයෙන් භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්වීම ආදී කරුණු හා පරිගණකයේ භෞතික පැවැත්ම අක්‍රිය කරන්නාවූ ඒ හා සමාන කරුණු ඉතිරි වාරිකයන් නොගෙවා සිටීමට හේතු ලෙස ඉදිරිපත් කළ නොහැකි බව ණය දීමනාකරු කියා සිටින අතර, ණය ගැනුම්කරු ඊට එකඟ වේ.

11. මෙම ගිවිසුම මත සම්පූර්ණ මුදල ගෙවා නිමවීමට පෙර බස්නාහිර පළාත් සභාවේ කාලය ඉකුත් වීමෙන් පළාත් සභා මන්ත්‍රී ධූරය අහිමි වුවහොත් හෝ පළාත් සභාව විසුරුවා හැරියහොත් හෝ මොනයම් අන්දමකින් හෝ පළාත් සභා මන්ත්‍රී ධූරය අහෝසි වුවහොත් ණය ගැනුම්කරු මන්ත්‍රී ධූරයෙන් ඉල්ලා අස්වුවහොත් මෙම ගිවිසුම මත ගෙවීමට ඉතිරිව ඇති සම්පූර්ණ මුදල එකී මන්ත්‍රී ධූරය අහෝසි වූ දින සිට මසක් ඇතුළත ණය දීමනාකරු වෙත ගෙවීමට ණය ගැනුම්කරු පොරොන්දු වේ.

එලෙස මසක් ඉකුත්වීමට පෙර ඉතිරිව ඇති සම්පූර්ණ මුදල ගෙවීමට අපොහොසත් වුවහොත් එලෙස මසක් ඉකුත් වීමෙන් පසුව එළඹෙන සතිය තුළදී පරිගණකය ණය දීමනාකරුට භාර දිය යුතු බව ණය දීමනාකරු කියා සිටින අතර, ණය ගැනුම්කරු ඊට එකඟ වේ.

12. මෙම ගිවිසුම මත සම්පූර්ණ මුදල ගෙවා නිමවීමට පෙර ණය ගැනුම්කරු බස්නාහිර පළාතේ පළාත් සභා මන්ත්‍රී ධූරයෙන් නෙරපා හැරියහොත් පරිගණකය සියලු උපාංග සහිතව ණය දීමනාකරුට නැවත වහාම භාර දිය යුතු අතර මෙතෙක් ගෙවූ වාරික නැවත ණය ගැනුම්කරු වෙත ගෙවීමට තමන් බැඳී නොසිටින බව ණය දීමනාකරු කියා සිටින අතර ණය ගැනුම්කරු එය පිළිගනී.

13. මෙම ගිවිසුම මත සම්පූර්ණ මුදල ගෙවා නිමවීමට පෙර ණය ගැනුම්කරු මියගියහොත් ණය ගැනුම්කරුගේ උරුමක්කාර, අද්මිනිස්ත්‍රාසිකාර, පොල්මඃකාර, බලකාර, ලැබුම්කාර ආදීන් විසින් මෙම ගිවිසුම මත ගෙවිය යුතු සම්පූර්ණ ඉතිරි මුදල ණය ගැනුම්කරු මියගිය දිනයේ සිට මාස දෙකක් ඇතුළත ගෙවා නිමකළ යුතු බව ණය දීමනාකරු කියා සිටින අතර, ණය ගැනුම්කරු එය පිළිගනී.

එලෙස දෙමසක් ඉකුත් වීමට පෙර ඉතිරිව ඇති සම්පූර්ණ මුදල ගෙවීමට අපොහොසත් වුවහොත් එලෙස දෙමසක් ඉකුත් වීමෙන් පසු එළඹෙන සතිය තුළදී පරිගණකය ණය දීමනාකරුට භාර දිය යුතු බව ණය දීමනාකරු කියා සිටින අතර, ණය ගැනුම්කරු ඊට එකඟ වේ.

14. මෙම ගිවිසුම මත සම්පූර්ණ මුදල ගෙවා නිමවීමට පෙර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ පළාත් සභා ක්‍රමය ක්‍රියාත්මක වීම සම්පූර්ණයෙන් අහෝසි වුවහොත් හා / හෝ පළාත් සභාව මගින් ඉටුකරන කාර්යයන්, කර්තව්‍යයන් ඉටුකිරීමේ බලතල වෙනත් ආයතන පිහිටුවීමෙන් හෝ මොනයම් අන්දමකින් හෝ පැවරීමක් සිදු කළහොත් එවිට ණය ගැනුම්කරු විසින් එකී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හෝ එකී පළාත් සභා බලතල පවරනු ලබන අනුප්‍රාප්තික ආයතනයකට හෝ එකී ඉතිරි මුදල ගෙවීමට බැඳී ඇත්තේය.

15. මෙම ගිවිසුමේ සඳහන් කොන්දේසි හෝ විධිවිධාන කඩ කිරීම ගිවිසුම් නීතිය යටතේ සිදුකරන වරදක් ලෙස දෙපාර්ශවය පිළිගන්නා අතර, ගිවිසුම් කඩකිරීමේදී ගිවිසුම් නීතියේ අදාළ වන නෛතික ප්‍රතිකර්මයන් අදාළ කරගත හැකි බව දෙපාර්ශවයම පිළිගනී.

මීට සාක්ෂි වශයෙන් ඉහත කී ණය ගැනුම්කාර හා ණය දීමනාකාර පාර්ශවයන් වන අපි මෙයටත් මේ හා සමාන තවත් ලේඛනයකටත් වර්ෂ ........................................... ක්වූ ................................ මස .............................. දින කොළඹදී අත්සන් තැබුවෙමු.

**සාක්ෂි :-**

මීට සාක්ෂිකාරයන් වන අපි මෙහි අත්සන් කළ ණය ගැනුම්කාර හා ණය දීමනාකාර පාර්ශවයන් හොඳින් හඳුනන බවද ඔවුන්ගේ නම් ගම් රක්ෂාවල් හා පදිංචි ස්ථානයන් හොඳින් දන්නා බවද මෙයින් ප්‍රකාශ කරමු.

...........................................

ණය දීමනාකරු,

සභා ලේකම්,

බස්නාහිර පළාතේ පළාත් සභාව.

1.

...........................................

ණය ගැනුම්කරු,

පළාත් සභා මන්ත්‍රී,

බස්නාහිර පළාතේ පළාත් සභාව.

2.

ගිවිසුම් අංකය :

## සහනදායී පදනමක් යටතේ පරිගණකයක් මිලදී ගැනීමේ අයදුම්පත

1. මන්ත්‍රීතුමාගේ / තුමියගේ නම :-

______________________________

2. මිලදී ගැනීමට අපේක්ෂිත පරිගණකයේ වර්ගය :

______________________________

3. මිලදී ගැනීමට අපේක්ෂා කරන උපාංග : (Computer, Printer, U.P.S., හා Modem අනිවාර්යය වේ.)

______________________________

4. පරිගණකය මිලට ගැනීමට අපේක්ෂිත ආයතනයේ නම සහ ලිපිනය :

______________________________

5. මිලදී ගැනීමට අපේක්ෂිත පරිගණකයේ මිල : ______________________________
(අදාළ ආයතනයෙන් නිකුත් කරන ලද අය පත (ඉන්වොයිසිය) මෙයට ඇමිණිය යුතු අතර චෙක්පත නිකුත් කරන්නේ මෙහි සඳහන් කරන මුදලටම පමණක් බැවින් මෙම අයදුම්පතේ සඳහන් මුදල පසුව සංශෝධනය කළ නොහැකි බව සැලකිය යුතුයි.)

6. මිලදී ගැනීමට අපේක්ෂිත පරිගණකය රඳවා තබන ස්ථිනය කාර්යාලයද නිවසද යන වග හා එම ස්ථානයේ ලිපිනය : ______________________________

______________________________

ඉහත විස්තර සඳහන් පරිගණකය මිලදී ගැනීම සඳහා රුපියල් ........................................ (රු. ....................................) ක් වටිනා චෙක්පතක් ඉහත අංක 4. හි සඳහන් ආයතනය නමට නිකුත්කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

..............................................................

දිනය :- ...............................  අයදුම්කරුගේ අත්සන

නිල මුද්‍රාව.

ගිවිසුම් අංකය :

# පරිගණකයක් ලබා ගත් බවට වූ ණය ගැනුම්කරුගේ ප්‍රකාශය

______________________________________________________________

යන ලිපිනයේ පදිංචි _______________________________________________

මෙහි ප්‍රකාශක වන මා හට පරිගණකයක් ලබා ගැනීම සඳහා බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභා ලේකම් කාර්යාලය මගින් ________________________________________

ලිපිනයැති ______________________________________________________

නම්වූ ආයතනය වෙත ________________ දින නිකුත් කරන ලද රුපියල් __________

______________________________ (රු. _________________ ) ක් වටිනා චෙක්පත ඉහත කී ආයතනය වෙත ඉදිරිපත්කර සහ මවිසින් එම ආයතනයට පෞද්ගලිකව ගෙවිය යුතු රුපියල් ______________________________________ (රු. ____________) ක් වටිනා මුදලද ගෙවා මුද්‍රණ යන්ත්‍රය (Printer), විදුලි බල සැපයුම් ඒකකය (U.P.S.) හා ෆැක්ස් හා ඊ මේල් පහසුකම් ලබාගැනීමට අදාළ මෝඩම් යන උපාංගද සහිතව පරිගණකයක් වර්ෂ ________ ක් වූ __________________ මස __________________ දින ඉහත කී ආයතනයෙන් මිලදී ගත් බවත්, එම පරිගණකය අංක ______________________________________ ______ ලිපිනයැති මාගේ නිවසේ / කාර්යාලයේ සවිකර ඇති බවත් වර්ෂ ____________ ක්වූ ___ ________________________ මස _____________ දින ප්‍රකාශ කර අත්සන් තබමි.

______________________________

ප්‍රකශක